# විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකර
# ජනාධිපති-අගමැති ව්‍යවස්ථාමය සන්ධානයක් ඇති කිරීම උදෙසා

## පිවිතුරු හෙටක් ජාතික සභාව විසින්

# වත්මන් පාර්ලිමේන්තුව වෙත යෝජනා කරන
# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

---

පසුගිය වසර 36 තිස්සේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ විධායක ජනාධිපති ක්‍රමයේ විවිධ වූ අනර්ථයන් මේ වනවිට මුළු මහත් සමාජයම ඉතා හොඳින් අවබෝධ කරගෙන ඇත. එම නිසා දැනට පවත්නා විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකර ජනාධිපති-අගමැති ව්‍යවස්ථාමය සන්ධානයක් ඇති කිරීම උදෙසා වර්තමාන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කෙරේ.

1. **ස්වරූපය -** නව රාජ්‍ය පාලන ක්‍රමය ජනාධිපති-අගමැති ව්‍යවස්ථාමය සන්ධානයක් වේ. ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා වන අතර අගමැතිවරයා ආණ්ඩුවේ නායකයා වේ.

2. **ජනාධිපතිවරයා -** ජනතාව විසින් ජනාධිපතිවරණයකින් වසර 6ක් සඳහා ජනාධිපතිවරයකු පත් කරනු ලැබේ. එම පත්වීම ලද විට ජනාධිපතිවරයා තවදුරටත් දේශපාලන පක්ෂයක සාමාජිකයෙක් නොවන අතර නැවත එම ධුරයට පත්වීමට ද නුසුදුස්සෙක් වන්නේය. ජනාධිපති සන්නද්ධ හමුදාවන් හී විෂයට සීමා වූ ආරක්ෂක ඇමති වනු ඇත. ජාතික සමගිය සහ එකමුතු බව ද ආගමික සංහිඳියාව ද ප්‍රවර්ධනය කිරීම ජනාධිපතිවරයා වෙත පැවරෙන කාර්යයක් වේ. ඒ අනුව රටේ ඒකීයභාවයට හෝ ස්වාධිපත්‍යයට හෝ හානිකර තත්වයක් උදාවන අවස්ථාවන්හි දී රට සුරක්ෂිත කිරීමේ වගකීම හා බලය ජනාධිපතිවරයාට පැවරේ.

3. **අගමැතිවරයා හා අමාත්‍ය මණ්ඩලය -** පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම පමණකින් ලබා ඇති මන්ත්‍රීවරයා අගමැති වශයෙන් පත්වේ. කැබිනට් මණ්ඩලය ඇමතිවරුන් සංඛ්‍යාව 20 සිට 25 අතර සංඛ්‍යාවකට සීමා වන අතර, නියෝජ්‍ය ඇමතිවරුන්ගේ සංඛ්‍යාව ද 35 කට නොවැඩි වේ. අගමැතිවරයාගේ යෝජනාවෙන් ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලය සඳහා මන්ත්‍රීවරුන් අතරින් පත් කරනු ලැබේ. මහමැතිවරණයකින් පසුව අගමැති සහ ඇමතිවරුන් පත් වූ විට ඔවුන් නැවත මහමැතිවරණයක් අවසන් වන තෙක් තනතුරු දරනු ඇත. ඇමතිගේ කාර්ය සාධනය ඇගයීමකින් පසුව අගමැතිගේ ද අනුමැතිය සහිතව ඇමතිවරයෙකු තනතුරෙන් ඉවත් කිරීමට ජනාධිපතිවරයාට බලයක් ඇත. පාර්ලිමේන්තුව, ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත ප්‍රතික්ෂේප කළ හොත් නැතිනම් ආණ්ඩු කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් සම්මත කළ හොත්, අමාත්‍ය මණ්ඩලය විසිරී යනු ඇත. එවිට අදහස් විමසීමේ පිළිවෙත අනුගමනය කරමින් ජනාධිපතිවරයා විසින් නව අගමැතිවරයෙක් සහ ඇමතිවරුන් පත් කළ යුතුවේ.

4. **ධූර කාලය -** ජනාධිපතිවරයාගේ සහ පාර්ලිමේන්තුවේ ධූර කාලය එකට ගෙවී යන අතර, ඡන්ද දෙකම එකට පැවැත්වේ. ජනාධිපති සහ පාර්ලිමේන්තුව සමාන්තර වූ නිශ්චිත සය අවුරුදු කාලයකට ධූර දරණු ඇත. ජනාධිපතිගේ ධූර කාලය එක් සය අවුරුදු කාල පරිච්ඡේදයකට සීමාවනු නිසා තමන්ට වාසි සහගත ලෙස මැතිවරණ නියම කිරීමෙහි අවකාශය සහ අවශ්‍යතාවය ගිලිහී යනු ඇත. සම්පූර්ණ කාල සීමාව ඉක්ම යෑමට පෙර ඡන්ද පැවැත්වීමට බලයක් ජනාධිපතිට පැවරී තිබෙන නමුත් එමගින් නැවත ඡන්දයට ඉදිරිපත්වීමට අවකාශයක් නැතිව තමන්ගේ ධූර කාලය අවසන්වීම නිසා එකී අභිමතය ජනාධිපති විසින් අයථා ලෙස භාවිතා කිරීම් වැලකේ.

5. **අමාත්‍යාංශ විධායක කාරක සභා සහ ලේකම්වරු -** අමාත්‍යාංශ සඳහා විධායක කාරක සභා ක්‍රමය ස්ථාපනය වනු ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රීන් 5 දෙනෙකුගෙන් සහ පළාත් සභාවකින් එක් නියෝජිතයෙක් බැගින් වන පරිදි සාමාජිකයන් 14 දෙනෙකුගෙන් සමන්විත විධායක සභාවක් අමාත්‍යාංශයක් සඳහා පත්වෙනු ඇත. යෝජිත ව්‍යවස්ථාව යටතේ ලේකම්වරු පත්විය යුත්තේ ජනාධිපතිවරයාගේ, අගමැතිවරයාගේ සහ අදාල ඇමතිවරයාගේ එකඟත්වය මතය. තවද එසේ පත්කළ යුත්තේ රාජ්‍ය අංශයේ වෘත්තීයකයෙක් පමණක් වේ.

6. **පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය - මනාප ක්‍රමය අහෝසි කිරීම සඳහා මැතිවරණ ක්‍රමය වෙනස් කෙරේ.** පාර්ලිමේන්තුව දැන් පවත්නා අයුරින්ම මන්ත්‍රීවරුන් 225 කින් සමන්විත වේ. දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් වූ මැතිවරණ ප්‍රතිසංස්කරණය පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවෙන් සියළු පක්ෂ වල කැමැත්ත අනුව යෝජිත නව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය නීති ගත වනු ඇත. මැතිවරණය පැවත්වෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීමට පෙර පැවති භූගෝලීය ආසන තුළය. එම ආසන සඳහා නාම යෝජනා, පිළිගත් දේශපාලන පක්‍ෂ තුළින් හෝ දිස්ත්‍රික්කයටම පිළිගත් ස්වාධීන කණ්ඩායමක් තුළින් ඉදිරිපත් විය යුතුය. ආසනයකට එක් මන්ත්‍රීවරයෙක් බැගින් ආසනයේ වැඩිම ඡන්ද ලබා ගත් අපේක්ෂකයා කේවල ක්‍රමයට ආසනයේ මන්ත්‍රීවරයා ලෙස පත්වේ. ජාතික ලැයිස්තු වලින් මන්ත්‍රීවරුන් 15 දෙනෙක් අනුපාත ක්‍රමයට පත්වේ. ඉතිරි ආසන සඳහා දිස්ත්‍රික්ක 22 න් මන්ත්‍රීන් අනුපාත ක්‍රමයට පත්වනු ඇත. අනුපාතය තීරණය කිරීම සඳහා ගණන් ගනු ලැබෙන්නේ දිස්ත්‍රික්කය තුළ එක් එක් ආසන වල පරාජිත අපේක්ෂකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව පමණි. එහිදී තේරී පත්වෙන්නේ ඒ ඒ පක්ෂයේ වැඩිම ඡන්ද අනුපාතයක් ලබා ගෙන පරාජය වූ අපේක්ෂකයින්ය. කේවල ක්‍රමයට පත් වූ මන්ත්‍රී ආසනයක් හිස්වූ විට එම ආසනයේ පමණක් අතුරු මැතිවරණයක් පවත්වනු ඇත. දිස්ත්‍රික් ආසනයක් පුරප්පාඩු වූ විට ලැයිස්තුවේ ඊළඟට සිටින අයට මන්ත්‍රීධූරය හිමිවේ. ජාතික ලැයිස්තුවේ පුරප්පාඩුව පුරවන්නේ ලේකම්වරයා විසින් සිය ජාතික ලැයිස්තුවේ වෙනත් නමක් යෝජනා කිරීම මගිනි.

7. **ව්‍යවස්ථාදායක සභාව -** පසුගිය දශක කිහිපය පුරා රටේ අවධානයට ලක්ව තිබූ අල්ලස් හා දූෂණ වලට වැට බැඳීම සඳහා **ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනය නැවත නීති ගත කෙරේ. එහි දැනට දක්නට ලැබෙන ප්‍රධානතම අඩුපාඩුව වූ** ව්‍යවස්ථාදායක සභාවට සාමාජිකයන් පත් කිරීමේ ක්‍රමවේදය වෙනස් කෙරේ. ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයින් වන්නේ අගමැතිවරයා, කථානායකවරයා (සභාපති), විපක්ෂ නායකවරයා, ජනාධිපතිවරයා විසින් පත් කළ අයෙකු හා පාර්ලිමේන්තුව විසින් රහස් ඡන්දයෙන් පත් කරනු ලබන 05 දෙනෙකු ය. එම 5 දෙනා රහස් ඡන්දයෙන් පත්කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත නාම යෝජනා ඉදිරිපත් කළ හැකිවන්නේ කථානායකවරයා විසින් කැඳවනු ලැබීමෙන් අනතුරුව ජාතික මට්ටමේ විද්වත් මණ්ඩල වලට, විශ්ව විද්‍යාල උපකුලපති මණ්ඩලයට හා ලංකා වාණිජ මණ්ඩලයට වේ.

8. **අල්ලස් හා දූෂණ වලට වැට බැඳීම උදෙසා හඳුන්වාදෙන අණපනත් -** ශ්‍රී ලංකා රජය විසින් දැනටමත් අත්සන් කර ඇති දූෂණ පිටු දැකීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ සම්මුතිය රට තුළ බලාත්මක කිරීම උදෙසා පසුගිය සමයේ දී රජය විසින් ඉදිරිපත් කළ අල්ලස් හා දූෂණ පිටු දැකීම සඳහා වූ පනත සම්මත කිරීමට කටයුතු කෙරේ. අල්ලස් හා දූෂණ කොමිසම, පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීමට පමණක් සීමා නොවූ රාජ්‍ය අංශය පමණක් නොව පුද්ගලික අංශය ද ආවරණය වන විධිමත් සක්‍රිය ආයතනයක් බවට පත් කෙරේ. තවද රාජ්‍ය හා පුද්ගලික අංශ වල මහා පරිමාණ දූෂණ හා ආර්ථික අපරාධ පිළිබඳව විමර්ශණය කර ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධිකාරියක් ද ස්ථාපිත කෙරේ.